# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2408/16 – 2024 නොවැම්බර් මස 02 වැනි සෙනසුරාදා – 2024.11.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2023/129.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ලංකා බැංකු සේවක සංගමය, අංක 20, පන්සල පාර, කොළඹ 10.

සහ

HDFC බැංකුව, තැ. පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, මාඹුල්ගොඩ, ජයසිංහ පාර, අංක 79, ''ඉෂාරා'' ආචාර්ය ආරියරත්න හොරදුගොඩ ගමගේ මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය හරිනි අමරසූරිය,
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2023/129.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා බැංකු සේවක සංගමය, අංක 20, පන්සල පාර, කොළඹ 10.

සහ

HDFC බැංකුව, තැ. පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''HDFC බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධන පුහුණුකරුවන් (Business Promotion Trainee - BPT) ලෙස බඳවාගෙන ඇති පහත නම් සඳහන් සේවකයින් අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව පුහුණු කාල සීමාව අවසන් වූ පසු කණිෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන සහකාර (Junior Business Promotion Assistant - JBPA) තනතුරට පත්කිරීමට අවශ්‍ය කටයුතු HDFC බැංකුව විසින් සිදු නොකිරීම මගින් එම සේවකයින්ට අසාධාරණයක් සිදු වී තිබේ ද? අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.''

| | නම | | නම |
|---|---|---|---|
| 1. | ඩී. එම්. එස්. ප්‍රදීප් | 9. | එන්. ජී. සී. බී. ඩී. ධර්මදාස |
| 2. | යූ. ජී. ඩබ්. සී. බී. විජේසූරිය | 10. | කේ. ඒ. එස්. කේ. කහඳවආරච්චි |
| 3. | ජේ. ඒ. ඩී. පී. ජයකොඩි | 11. | එන්. ලිදර්ශන් |
| 4. | යූ. ඒ. එම්. එස්. එස්. එස්. බණ්ඩාර | 12. | ඊ. ජී. ඕ. පී. හේමවර්ධන |
| 5. | ඩී. එස්. ඩබ්. මදනායක | 13. | ආර්. ඩී. සී. සිල්වා |
| 6. | ආර්. තවප්‍රකාශ් | 14. | ටී. පී. එල්. කුමාර |
| 7. | වයි. එල්. එම්. එච්. ප්‍රමුදිත | 15. | කේ. රුබන් |
| 8. | ජී. නිශාන්තන් | 16. | ජේ. සී. එම්. ජයලත් |

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0003

මගේ අංකය: IR/COM/01/2023/129(1).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ලංකා බැංකු සේවක සංගමය, අංක 20, පන්සල පාර, කොළඹ 10.

*සහ*

HDFC බැංකුව, තැ. පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, මාඹුල්ගොඩ, ජයසිංහ පාර, අංක 79, ''ඉෂාරා'', ආචාර්ය ආරියරත්න හොරදුගොඩ ගමගේ මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2023/129(1).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා බැංකු සේවක සංගමය, අංක 20, පන්සල පාර, කොළඹ 10.

*සහ*

HDFC බැංකුව, තැ. පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ –

"HDFC බැංකුවේ 2020 වර්ෂයට අදාළ ප්‍රසාද දීමනාව 2020 දෙසැම්බර් මස වැටුප පදනම් කර ගනිමින් 2022 වර්ෂයේ දී ගෙවීමේ දී පහත නම් සඳහන් පොදු කාර්ය සහායකයින්ගේ ජීවන වියදම් දීමනාවට අදාළව එම ප්‍රසාද දීමනාව ගණනය නොකිරීමෙන් එම සේවකයින්ට අසාධාරණයක් සිදුවී තිබේ ද? අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.''

| *නම* | *නම* |
|---|---|
| 1. ජී. ඩී. එස්. කුමාර | 12. කේ. වී. සිරන්ජීවන් |
| 2. කේ. ජී. සඳරුවන් | 13. එම්. ජී. ඒ. පෙරේරා |

| නම | නම |
|---|---|
| 3. පී. එස්. දිල්රුක්ෂි | 14. කේ. කේ. නිශාන්ත |
| 4. කේ. පී. එල්. සී. කරුණානායක | 15. ආර්. ඒ. ඒ. රන්ජීව |
| 5. ආර්. ඩී. එම්. සී. රණතුංග | 16. බී. එස්. එම්. කුරේ |
| 6. ඊ. ඒ. එම්. පී. එදිරිසිංහ | 17. එම්. ඒ. එම්. මධුෂානි |
| 7. සී. එම්. ලොකු හේවාගම | 18. එම්. ඒ. එම්. ගුණතිලක |
| 8. ජේ. සරෝජිනී | 19. පී. ජී. කේ. චම්පික |
| 9. පී. ජී. ඩී. රත්නසිරි | 20. එම්. එන්. එස්. පී. කුමාර |
| 10. ඩී. ඩී. ඩබ්. ප්‍රශාන්ත කුමාර | 21. එම්. ඩබ්. ඩී. එම්. කේ. රත්නසිරි |
| 11. කේ. ඒ. එස්. එල්. චන්ද්‍රා | 22. පී. ජී. කේ. එන්. පල්ලෙපිටිය |

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0004

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.